## උතුරු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ වූ ප්‍රාථමික ශ්‍රේණියේ දෙපාර්තමේන්තුගත සේවා තනතුරු පුරප්පාඩු පිරවීම-2018

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013/01/01 දින උතුරු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ අනුමත සේවක සංඛ්‍යාවට අනුකූලව පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම පිණිස අදාළ බඳවා ගැනීමේ පරිපාටිය යටතේ සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්න අවසාන දිනය 2018.06.06 වේ.

| තනතුරු අංකය | තනතුරු නාමය | පවතින පුරප්පාඩු සංඛ්‍යාව | තෝරා ගැනීමේ පරිපාටිය | වැටුප්කේතය හා වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| 01 | උපස්ථායක | 3 | විවෘත | PL 2-2016 |
| 02 | උපස්ථායිකා | 7 | පදනම මත 70% | 25,250-10*270 |
| 03 | අරක්කැමි | 1 | සීමිත-30% | 10*300-10*330 |
| 04 | විදුලිකාර්මික | 1 | | 12*350 |
| | | | | 38,450/- |
| 05 | කම්කරු(පිරිමි) | 4 | විවෘත | PL 1-2016 |
| 06 | කම්කරු(කාන්තා) | 1 | පදන්ම මත 100% | 24,250-10*250 |
| 07 | සනීපාරක්ෂක | | | 10*270-10*300 |
| | කම්කරු | 1 | | 12*330 |
| 08 | මුරකරු | 1 | | 36,416/- |

### සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි

01) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

02) මෙම තනතුරට පත්කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

**03)** ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

**04)** මෙම සේවය ස්ථාන මාරු කිරීම්වලට යටත් නොවන සංවෘත සේවාවන් වේ.

**මූලික සුදුසුකම්**

01) අයදුම්කරු ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතුයි.

02) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වර්ෂ **06**ක කාලයෙන් වර්ෂ **03**ක කාලයක් උතුරු පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි. (සම්මුඛ පරීක්ෂණයේදී ඡන්ද හිමි නාම ලේඛණයේ උධෘත මගින් ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි.

**හෝ**

අයදුම්කරු හෝ අයදුම්කරුගේ මවුපියන් හෝ උතුරු පළාතේ උපත ලබා, අවම වශයෙන් වර්ෂ **05**ක කාලයක් උතුරු පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී ඡන්ද හිමි නාම ලේඛණයේ උධෘත මගින් ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි.

03) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු **45**ට නොවැඩි විය යුතුය. සීමිත පදනම මත වූ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.

04) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර උතුරු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් සූදානම් ව සිටිය යුතුය.

05) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම් සුදුසුකම්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර හෝ සෑම ආකාරයෙන් සම්පූරණ කර තිබිය යුතුයි.

**බඳවා ගැනීමේ ක්‍රමය**

01) පවතින පුරප්පාඩු ප්‍රමාණය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු එකතුව මත පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

**<u>විවෘත පදනම මත</u>**

**අ) <u>අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම්</u>**

1) **අ.පො.ස(සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයකු එක්වරක දී විෂයයන් 05ක් සමත් විය යුතුය.**

**ආ) <u>වෘත්තීය සුදුසුකම්</u>**

**I. <u>උපස්ථායක/උපස්ථායිකා</u>**

**රෝගීන් ඇප උපස්ථාන කිරීම පිළිබඳ රජයේ රෝහලක හෝ රජය විසින් අනුමත පෞද්ගලික රෝහලක හෝ වසරක පළපුරුද්ද තිබිය යුතුය.**

**සැ.යු:- යථෝක්ත සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් ප්‍රමාණවත් අයදුම්පත්‍ර නොලැබෙන අවස්ථාවක දී, අධ්‍යාපන සුදුසුකම් ඇතුළුව උපස්ථායක තනතුරට අදාල ක්ෂේත්‍රයක පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් ද බඳවා ගැනීමේ බලය, පත්කිරීමේ බලධාරියා සතුය.**

**II. <u>අරක්කැමි.</u>**

**අයදුම්කරු රාජ්‍ය ආයතනයක හෝ රජය විසින් පිළිගත් ආයතනයක හෝ මාස හයක අරක්කැමි (ආහාර පිසීමේ) පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.**

**හෝ**

**අයදුම්කරු රජය විසින් අනුමත නවාතැන් පළක/ආයතනයක වසර තුනක අරක්කැමි සේවාවේ පළ පුරුද්ද.**

**III. සැ.යු:- යථෝක්ත සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් ප්‍රමාණවත් අයදුම්පත්‍ර නොලැබෙන අවස්ථාවක දී, අධ්‍යාපන සුදුසුකම් ඇතුළු ව <u>අරක්කැමි.</u>**

තනතුරට අදාල ක්ෂේත්‍රයක පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් ද බඳවා ගැනීමේ බලය, පත්කිරීමේ බලධාරියා සතුය.

**IV.** **විදුලි කාර්මික**

අයදුම්කරු රජය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික පාඨමාලාවක් (අවම වශයෙන් මාස තුනක) සම්පූර්ණකර තිබිය යුතුය.

**හෝ**

a) රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතනයක විදුලි කාර්මික ක්ෂේත්‍රයට අදාල තනතුරක වසර තුනක පළපුරුද්ද.
b) විදුලිබලය සැපයුම විදුලි බල සම්බන්ධතාව පිළිබඳ උපායමාර්ගික දැනුම තිබිය යුතුයි.
c) අයදුම්කරුට විදුලිය සැපයුම හා අදාල ඉදිකිරීම්/අලුත්වැඩියා කිරීමේ හැකියාව තිබිය යුතුයි.

**සීමිත පදනම මත**

**01)** කයිතඩි රජයේ වැඩිහිටි නිවාසයේ, කම්කරු, සනීපාරක්ෂක කම්කරු සහ මුරකරු තනතුරු දරන්නන් අයදුම්කළ හැක.

**02)** පූර්ව සේවයේ අවම වශයෙන් වසර පහක කාර්යක්ෂම හා සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක **05**ක් උපයා තිබීම.

**03)** **වෘත්තීය සුදුසුකම්**

**a) උපස්ථායක/උපස්ථායිකා**

කයිතඩි රජයේ වැඩිහිටි නිවාසයේ අවම වශයෙන් මාස හයක සේවා පළපුරුද්ද.

**b) අරක්කැමි**

අයදුම්කරු රාජ්‍ය ආයතනයක හෝ රජය විසින් පිළිගත් ආයතනයක වසරක අරක්කැමි පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

c) <u>විදුලි කාර්මික</u>

රජය විසින් පිළිගත් ආයතනයක අවම වශයෙන් මාස තුනක විදුලි කාර්මික පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

## <u>අයදුම් කිරීමේ ක්‍රමය</u>

1) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ අයදුම්පත සකස් කරගත යුතුය.
2) එකකට වැඩි තනතුරක් සඳහා අයදුම්කරන්නන් සෑම තනතුරක් සඳහා ම වෙන් වෙන්ව අයදුම් කළ යුතුයි.
3) සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2018.06.06 දින හෝ එදිනට ප්‍රථම "ලේකම්, කාන්තා කටයුතු, සමාජ සේවා අමාත්‍යංශය, උතුරු පළාත, අංක 4, බෘෘඩ් පටුමග, පුංගන්කුලම් හංදිය අසළ, නුවර පාර, අරියාලේ, යාපනය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන සියලුම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි තනතුරු නාමය, විවෘත පදනම/සීමිත පදනම මත වූ අයදුම්පතක් යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි.
5) නියමිත ආදර්ශයට අනුකූල නොවන, ඇපැහැදිලි අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරණු ලැබේ.
6) බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව, යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති, බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

7) **පත්වීම් ප්‍රමාණය හා පත් කිරීමේ දිනය පත්වීම් බලධාරියා විසින් තීරණය කෙරෙනු ඇත.**

8) **සේවයේ අවශ්‍යතාවය මත මෙම පුරප්පාඩු වූ තනතුරු පිරවීමේ දී, එකී පුරප්පාඩු වලින් කොටසක් හෝ සියලුම තනතුරු පිරවීම පිළිබඳ තීරණය පත්වීම් බලධාරියා විසින් ගනු ලැබේ.**

**ලේකම්,**

**කාන්තා කටයුතු හා සමාජ සේවා අමාත්‍යාංශය උතුරු පළාත.**